සියල්ලටම ඇත්තේ තව එක් දිනයක් පමණකි. ප්‍රගති වාර්තාව සකස් කිරීමට කාලයක් නැත.
මේ හත්වන බාධකයයි.

සතියකට අවශ්‍ය ඇඳුම් සකස් කර ගැනීම, ගුවන් ගමන තහවුරු කර ගැනීම, අධ්‍යාපන අමාත්‍යංශයට ගොස් නිවාඩු ලියවිල්ල අත්සන් කිරීම, විදේශ විනිමය ලබාගැනීම වැනි අත්‍යවශ්‍ය කටයුතු සියල්ල කිරීමට ඇත්තේ තව පැය කිහිපයක් පමණකි.

විදේශ නිවාඩු අයදුම්පත, අධ්‍යාපන අමාත්‍යංශයට ලියාපදිංචි තැපෑලෙන් යැවීමට සූදානම් කර තැබීම්

පසුදින, කෙසේ හෝ සියල්ල යන්තමින් හෝ අවසන් කරගෙන නියමිත වේලාවට කටුනායක ගුවන් තොටට ගියෙමි. එය මගේ පළමු ගුවන් ගමන විය. අනිකුත් අය කරන දේ නිරීක්ෂණය කර මමද ගුවන් තොටෙහි අවශ්‍ය දේ සියල්ල කර ගතිමි. පිටත්වීම් මැදිරියට ගොස් වාඩිවී සැනසුම් හුස්මක් හෙළා, පසුගිය දින කිහිපයේදී කඩිමුඩියේ කළ කී දේ සියල්ලත්, මුහුණ පෑ බාධක මැඩගත් ආකාරයත් ආවර්ජනය කළෙමි. ආධුනිකයෙකු වුවත් සියල්ල කලට වෙලාවට කරගැනීමට ආත්ම ධෛර්යයක් ලැබීම ගැන තරමක සතුටක්ද ඇතිවිය.

නියමිත වේලාවට ගුවන් යානයට ඇතුල්වී


පිලිපීන විශ්ව විද්‍යාලයේ විද්‍යා අන්තර්කරණ මධ්‍යස්ථානය

සුව පහසුවට වාඩිවී වැඩ මුළුව සඳහා අවශ්‍ය අපගේ ප්‍රගති වාර්තාව සකස් කිරීමට පටන් ගත්තෙමි. පැය දෙකකදී පිටු පහක පමණ වාර්තාවක් සකස් කර ගත හැකි විය. මේ වන විට අමාරු බාධක කිහිපයකින් පැන ගැනීමට හැකිවීම ගැන සතුටට පත්වීමි. තවත් පැය දෙකකින් පමණ ගුවන් යානය බැංකොක් ගුවන් තොටට ළඟාවිය. ගමනේ ඉතිරි කොටස ආරම්භ කිරීමට තව පැය කිහිපයක් තිබුණු නිසා විවේකාගාරයට ගොස් සැනසිල්ලේ සිටියෙමි.

මෙහි ටික වේලාවක් සිටින විට, එහි පැමිණි තවත් ගුවන් මගියෙකු මා ඉදිරිපිට වූ ආසනයක වාඩිවී APIED නම පිට කවරයේ තිබුණු වාර්තාවක් කියවන්නට විය. ඔහුද මා යන ගමනම යන කෙනෙක් බව එයින් අවබෝධ කර ගත්තෙමි. සුදුසු අවස්ථාවක් බලා මම ඔහු සමග කථා කළෙමි. වැඩ මුළුවේ ඉන්දියාව නියෝජනය කරනුයේ ඔහුය.

ඔහු නමින් මිශ්රා ය. ඔහු මෙවැනි වැඩ මුළු වලට සහභාගිවී පළපුරුද්ද ඇති අයෙකි. ආගිය තොරතුරු කතාබස් කිරීමේදී, ඔහු ඉන්දියාවේ ගුරු විද්‍යාලයක ජීව විද්‍යා අධ්‍යාපනය පිලිබඳ උපදේශකවරයෙකු බව දැනගතිමි. අප දෙදෙනා අපගේ වාර්තා හුවමාරු කරගෙන කියවිමු. පිටු තිහක් පමණ වූ ඔහුගේ වාර්තාව පරිගණක ගතකර පොතක් ලෙස සකස් කර තිබුණි. ඔහු සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව මගේ වාර්තාවටත් අලුත් කරුණු කිහිපයක් ඇතුලත් කළ හැකි විය. එහෙත් මගේ වාර්තාව තවමත් සංස්කරණය නොකළ අත් පිටපතකි.

අපගේ ගමනේ ඊළඟ කොටසට නියමිත ගුවන් යානයට ගොඩවන වේලාව එළඹියේය.

මිශ්රාට ලැබුනේ යානයේ තරමක් පසුපස ආසනයකි. අපි පැය තුනකින් පමණ මැනිලා ගුවන් තොටින් බැස්සෙමු. අප පිටතට එනවාත් සමගම අපගේ නම් විශාල අකුරෙන් ලියන ලද කාඩ් බෝඩ් තීරු ඔසවාගත් කිහිප දෙනෙක් අප බලාපොරොත්තුවෙන් සිටියහ. බංගලාදේශ නියෝජිත වරියත්, නේපාල රටේ නියෝජිතයාත් අප ආ යානයේම ගමන් කර තිබුණි. පැමිණ සිටි අය විසින් අප සිව් දෙනා කැටුව හෝටලයකට ගොස් අපගේ නවාතැන් පහසුව සලසා දුන්හ. එදින රාත්‍රී ආහාරයට පෙර පැයක පමණ, අවශ්‍යතා පිලිබඳ අවිධිමත් සාකච්ඡාවක් හෝටලයේදී පවත්වන බවත් දැනුම් දෙන ලදී.

රටවල් සියල්ලේම නියෝජිතයෝ සාකච්ඡාවට සහභාගී වුහ. ටික වෙලාවක් සාකච්ඡා කිරීමෙන් පසු රටෙහි ප්‍රගති වාර්තාවල (Country report), පිටපත් සකස් කිරීම සඳහා සියලූ දෙනාගේම වාර්තා එකතු කර ගන්නා ලදී. මගේ වාර්තාව පිළිබඳව උද්ගතවී ඇති තත්ත්වය, සාකච්ඡාව මෙහෙයවූ නිලධාරිනියට කී විට, එය පරිගණක ගත කර පිටපත් සකස් කිරීම ලිපිකාරිණියකට පවරන ලදී. ඇය විනාඩි දහයක් ඇතුළතදී එය සකස් කර කියවා බැලීමට ආපසු මට දුන්නාය. එහි තිබුණු අපගේ ශ්‍රී ලාංකික නම් ගම් පවා සියල්ල නිවැරදිව පරිගණක ගත කිරීම ගැන මම පුදුමයට පත්වීමි. එය සංස්කරණය කර ආපසු දී විනාඩි කිහිපයකදී පොතක් මෙන් සකස් කර නියමිත පිටපත් සංඛ්‍යාව මා අත පත් කළාය.
තවත් එක් බාධකයකින් පහසුවෙන්ම පැන ගතිමි.

පසුවදා, මැනිලාහි ක්වෙසෝන් සිටි (Quezon City) නගරයේ පිලිපීන විශ්ව විද්‍යාලයේ විද්‍යා අන්තර්කරණ මධ්‍යස්ථානයේදී (UPSIC), අපගේ වැඩ මුළුව ආරම්භ විය.

ආසියාතික සහ පැසිෆික් කලාපයේ රටවල් වල නියෝජිතයින් පසළොස් දෙනෙකු සහ තවත් රටවල් කිහිපයකින් පැමිණ සිටි නිරීක්ෂකයන්ද ඇතුළුව පිරිස විසි පස් දෙනෙක් සිටියහ. ආරම්භක දේශනය, වැඩ මුළු අධ්‍යක්ෂක තුමාගෙන් විය.
මේ සඳහා පැමිණියේ මා හොඳින් දැන සිටි, ශ්‍රී ලංකාවේ, පේරාදෙණිය විශ්ව විද්‍යාලයයේ වෛද්‍ය පීඨයේ මහාචාර්ය වැලන්ටයින් බස්නායක මැතිතුමාය. ශ්‍රී ලංකාවේ ජීව විද්‍යා අධ්‍යාපන උන්නතිය සඳහා ඇප කැප වී කටයුතු කර තිබෙන, එතුමා වැඩ මුළු අධ්‍යක්ෂක ධුරය හෙබවීම මටද ආඩම්බරයක් විය.

උදේ වරුව වෙන් කර තිබුණේ ඒ ඒ රටවල වාර්තා ඉදිරිපත් කිරීමටය. ඊට කලින් වාර්තා ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය වන ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ සැපයීම සඳහා, අවශ්‍ය දේ සටහන් කරන ලෙස ඉල්ලන පත්‍රිකාවක් අප අතට එවන ලදී. ජපාන. මැලේසියානු, ඉන්දුනිසියානු සහ කොරියානු සගයින් ලේඛනයේ තිබුණු උපකරණ සියල්ලම පාහේ ලකුණු කර තිබුණි. මගේ වාරය පැමිණි විට මට ලකුණු කළ හැකි වුයේ ශීර්ෂ ප්‍රක්ෂේපකය (Over)head Projector- OHP) පමණකි.

එයට වුවද මගේ සූදානමක් නොවිය. මම අන් කිසිම ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණයක් භාවිත කරන ආකාරය දැන නොසිටියෙමි. මෙය අටවන බාධකයයි.

මම නැවතත් අසරණ තත්වයකට පත්වීමි. ඊට පසු එක් එක් නියෝජිතයා නියෝජනය කරනු ලබන රටේ නමෙහි අකාරාදී පිළිවෙලට වාර්තා ඉදිරිපත් කිරීම ආරම්භ කරන ලදී. ඒ ඒ රටෙහි තාක්ෂණ ප්‍රගතියද වාර්තා ඉදිරිපත් කිරීමේදී දකින්නට ලැබිණ. වාර්තා කියවීම ආරම්භ වීමත් සමගම ලිපිකාරිණිය, මගේ වාර්තාවේ තිබුණු වගු තුනක පාරදෘශ්‍ය පිටපත් (Transparencies) සකස් කර මට ගෙනවිත් දුන්නාය. මගේ ඉදිරිපත් කිරීම සඳහා, ශීර්ෂ ප්‍රක්ෂේපකය ඇති බවද ඇය කීවාය. මා සඳහන් කළ එකම ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණයට ගැලපෙන වගු කිහිපයක් මගේ වාර්තාවෙන් හඳුනා ගෙන, ඇය එසේ කරන්නට ඇත.

ඇයගේ දක්ෂ කම නිසා එම බාධකය මඳක් හෝ ඉවත් විය.

ජපානයේ මිතුරා තම වාරය පැමිණිවිට වේදිකාවට ගොස් සියලූ දෙනාටම හිස නමා ආචාර කර, යම් කිසි උපකරණ කිහිපයක් මේසය උඩ සකස් කර, ආපසු පැමිණ තම ආසනයේ වාඩිවී, දුරස්ථ පාලකයක් හසුරුවමින් තම වාර්තාව ඉදිරිපත් කළේය එය කාගේත් ප්‍රශංසාවට ලක්විය. ජපානයේ තාක්ෂණ දියුණුව ගැන මම විශ්මයට පත්වූයෙමි.
මගේ වාරයේදී, පිලිපීන ලිපිකාරිණියට ස්තුති වන්නට සකස් කර දුන් පාරදෘශ්‍ය පිටපත් නිසා අපේ ආත්ම ගරුත්වය යන්තමින් හෝ බේරා ගතහැකි විය.

ඒ දින හතරේදී ජීව විද්‍යා අධ්‍යාපනයේ නව ප්‍රවණතා, සරල ප්‍රායෝගික ක්‍රියාකාරකම්, නව ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ භාවිතය, පරිසර අධ්‍යාපනයේ නව පිවිසුම්, අපද්‍රව්‍ය කළමනාකරණය වැනි විෂයය කොටස් ගැන මනා අවබෝධයක් ලබාගැනීමට හැකිවිය. මෙසේ ලබාගත් දැනුම අපගේ විෂයය මාලා සංවර්ධනයේදී මහෝපකාරී විය.

ඒ කාලයේ නවීන තාක්ෂණය අතින් අප බොහෝ පසු පසින් සිටියත්, අද වනවිට අප ලබා ඇති දියුණුව ප්‍රසංශනීයය. කෙසේ වෙතත් ලෝකයේ බොහෝ රටවල් මේ වන විට අධ්‍යාපනයට නව තාක්ෂණය ශීඝ්‍රයෙන් භාවිත කරන ආකාරය නම් අපට තවමත් බොහෝ දුරස් බව පෙනේ.

House in 22P for Sale
Dehiwala Aththidiya

Right next to Arpico Supermarket !

Suitable for both residential and commercial purposes.

Perfect location for a housing/apartment project.

AUD 350,000 or
exchange with a property in Australia would be considered

Mobile/Viber/WhatsApp +94 76 947 0 937
Mobile (Ausi) +61 435 019 777

Alpha Academy 2017
Glen Waverley Classes

Grade 8 , 9 - Mathematics
Grade 8 , 9 - Science
Grade 8 ,9 - English
VCE Chemistry 1 , 2
VCE Biology 1 , 2
Other subjects - Upon request

- All students will be tested before enrolment , placed accordingly in the groups
- Unit Tests for all subjects
- VCE , SAC preparation guidance
- Ongoing updates for parents
- Multiple classes during week , enabling catch-up classes

To request an application,
please text student name, Class and school to
0457908918